# BELIEVERS EASTERN CHURCH

**Office of the Metropolitan, Synod Secretariat, St. Thomas Community, Thiruvalla, Kerala, India.**

## එඬේර හසුන .

ජනවාරි/පෙබරවාරි 2024

සියලු අගරදගුරුතුමන් සහ රදගුරුතුමන්, පූජකතුමන් සහ ඩීකන් පියතුමන්, ඉවැන්ජලිස්තතුමන් සහ සහෝදරියන් සහ බිලීවර්ස් ඊස්ටන් චර්ච්හි ලොව පුරා සිටින විශ්වාසිකයින් හට පියාණන් වහන්සේගේ ද, පුත්‍රයාණන් වහන්සේගේ ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන් ආසිරි සහ ආචාරය - ආමෙන්.

ක්‍රිස්තුන් වහන්සේ තුළ සෙනෙහෙවතුනි,

ක්‍රිස්තුන් වහන්සේ අප සමගය!

ශුද්ධ වූ සභාවේ ඉතාමත්ම වැදගත් සමය වෙත ළඟාවන අවස්ථාවේදී ඔබට ලිවීමට හැකිවීම පිළිබඳව ඉමහත් සතුටට කරුණකි. 'මහා චතාරික සමය' පෙබරවාරි මස 11 වෙනි දින ආරම්භ වී මාර්තු 31 අවසන් වේ.

මෙම සමය උපවාසව සිටිමින් යාච්ඤාවේ නියැලෙන කාලයක් වශයෙන් සලකනු ලබන අතර, එහිදී, ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට, සොහොන්ගෙයි තැන්පත් කරනු ලැබීමට සහ ජයග්‍රාහී උත්ථානයට තුඩු දුන් ක්‍රිස්තුන් වහන්සේ මිහිමත වාසය කළ අවසාන දිනය දක්වා සිහිපත් කරනු ලබයි. ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයින් සහ ඔවුන් වහන්සේගේ ශුද්ධ වූ

සභාවේ අනුගාමිකයින් වශයෙන්, අපි මෙම සමය දෙස බලා සිටින්නේ 'පාස්කු මංගල්‍යය' ඉතා අලංකාර ආකාරයෙන් සැමරීමට සූදානම් වීමට අපට උපකාර කරන බැවිනි. මෙම කාල වකවානුව තුළදී, අපගේ ආධ්‍යාත්මය අලුත් කර ගැනීම සඳහා සැබවින්ම නිහතමානීව සහ බිඳුණු භාවයෙන් යුතුව සෙමින් සෙමින් සහ විරාම තබමින් අපගේ ජීවිත පරීක්ෂා කර ගැනීමට අපි හිතාමතාම තේරීමක් කරමු.

මෙයට අමතරව, සභාවේ සියලුම විශ්වාසවන්ත සාමාජිකයින් සඳහා චතාරිකය පැවැත්වීමට ආධාරක කුළුණු තුනක් ඇත. එනම්,

**යාච්ඤාව:** චතාරික කාලය තුළදී, වැඩියෙන් යාච්ඤා කිරීමට අපව කැඳවා ඇත. අප වැඩි වැඩියෙන් යාච්ඤාවේ නිරත වන විට, දෙවියන් වහන්සේ වැඩි වැඩියෙන් අපගේ ජීවිත ස්වර්ගය මෙන් වෙනස් කරන සේක. අපගේ පාප වලට සමාව දී අපව තව තවත් දෙවියන් වහන්සේට සමාන කරන මෙන් ඉල්ලා අපි ඔවුන් වහන්සේට යාච්ඤා කරමු. එවිට දිනෙන් දින අපි අපගේ ජීවිත වල ආත්මික එල දරන්නන් බවට පත් වන්නෙමු.

**උපවාසයේ යෙදීම:** අපි ආහාර ගැනීමෙන් පමණක් නොව, අපගේ ජීවිත වල තිබෙන පව්කාර පුරුදු වලින්ද වැළකී සිටිය යුතුය. එමෙන්ම අප අපගේ ආශාවන් වලට වහල් නොවී, දෙවියන් වහන්සේගේ මහත් වූ දයාවෙන් සහ කරුණාවෙන් ජය ලබා දිව්‍යමය ස්වභාවයේ කොටස්කරුවන් විය යුතුය. අප සමහර ආහාර වලින් වැළකී සිටිනවා සේම, සෘණාත්මක සිතුවිලි, වචන සහ ක්‍රියාවන්ගෙන් වැළකී සිටිමු. මෙම කාලය තුළදී ආධ්‍යාත්මික වර්ධනය පෝෂණය කරන පරිසරයක් ගොඩනගා ගනිමින් ඔබගේ නිවස යාච්ඤාවේ සහ පරාවර්තනයේ අභය භූමියක් බවට පරිවර්තනය කර ගන්න.

**දන් දීම:** ශුද්ධ ලියවිල්ලේ යෙසායා 58:7 හි පවසන පරිදි, දුප්පතුන් සහ පීඩිතයින් වෙනුවෙන් අප අපගේ සැලකිල්ල සහ උපකාර ලබා දෙන විට අපගේ උපවාසය පිළිබඳව ද දෙවියන් වහන්සේ සතුටු වන්නේය. අප චතාරික කාලය තුළදී උපවාසයේ යෙදෙන විට, අවශ්‍යතා ඇති අය සමග බෙදා ගැනීමට මුදල් සහ අනෙකුත් සම්පත් ඉතිරි කරනු ලබයි. ඒවා අවශ්‍යතා ඇති අය සමග බෙදා ගැනීම තුළින් දෙවියන් වහන්සේ ප්‍රීති වන්නේය. මෙම 'මහා චතාරික සමයේදී' පවුලක් ලෙසින් මෙන්ම සභාවක් ලෙසින් ද දීම පුරුදු පුහුණු විය හැකිය.

මහා චතාරික සමය පැවැත්වීමේදී එහි ඉතා වැදගත් කොටස් දෙකක් ඇති අතර, ඒවා නම්, පුද්ගලයන් වශයෙන් අප කරන ක්‍රියා සහ සභාවක් ලෙස සාමුහිකව කරන ක්‍රියාවන් ය. මෙම අංගයන් දෙකම එක සමාන ආකාරයෙන් වැදගත් කමක් දරයි.

තනි තනිව, ස්වයං විනය පවත්වමින් පුද්ගලික යාච්ඤා කාලයන් පවත්වමින් භාවනායෝගීව අපගේ උපවාස විනය අනුගමනය කිරීමට අපි කැපවිය යුතුය, ඒ ආකාරයෙන්ම, අප අපගේ පවුල සමග එක්සත්ව හැකි තරම් පුණ්‍ය කටයුතු වලට සහභාගි වීමට උත්සාහ කළ යුතු බව ඔබට අවධාරණය කරන්නෙමි. අපට ඇති ප්‍රීතිය නම් මෙම ගමනේදී අපි තනි නොවීමය. අපගේ මීසම ආත්මිකව එකම පවුලක් බවට පත් වන අතර, එකිනෙකා නඟා සිටුවීම සඳහා සහයෝගය ලබා දෙනු ලබයි, මන්ද අපගේ එකමුතු භාවය තුළ අපට ශක්තිය සහ දිරිගැන්වීම ලැබෙන්නේය.

මෙයට අමතරව පහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන්ද ඔබගේ අවධානය යොමු කරන මෙන් මම ඔබගෙන් ඉල්ලා සිටිමි.

1. සභාවෙ ඇති සියලුම චතාරික සම්පත් භාවිතා කරන්නඃ ශුද්ධ වූ සිනෝඩය වෙතින්, ඔබ වෙත ලබා දී ඇති ශුද්ධ ලියවිලි කියවීම්, චතාරික සමයේ දිනපතා මෙනෙහි කිරීම්, දිනපතා යාච්ඤා පිළිවෙත, සහ උපවාස මාර්ගෝපදේශය වැනි ආධ්‍යාත්මික ආධාරකයන් අර්ථවත් ලෙස භාවිත කරන්න.

2. නිවසේ යාච්ඤා පූජාසනයඃ චතාරික කාලය යනු අප වැඩි වශයෙන් යාච්ඤාවේ නිරතවන කාලයක් වන අතර, එය අපගේ නිවෙස් වලද සිදුකළ යුතුය. චතාරික කාලය තුළදී නොවරදවාම පවුලේ යාච්ඤා අල්තාරය සකස් කිරීමටත් නිවෙසේ යාච්ඤාවන් සිදු කිරීමටත් අපි වග බලාගත යුතුය.

3. ජේසුස් වහන්සේගේ යාච්ඤාව එනම් "ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්ස, දේව පුත්‍රයාණෙනි, පව්කාරයෙකු වන මා හට කරුණා කළ මැනව." අපට දවස පුරා කළ හැකි එක් යාච්ඤාවකි. ඔබට යාච්ඤා දම්වැලක් (Prayer rope) තිබේනම්, මෙම යාච්ඤාව ඔබට හැකි තරම් වාර ගණනක් කළ හැකිය.

ශුද්ධ වූ සභාව මගින් කරනු ලැබූ මෙම ආරාධනය නොසලකා නොහරින ලෙස මම ඔබ සියලු දෙනා දිරිමත් කරන්නෙමි! ඔබගේ ආත්මික පියා ලෙස මම ද ඔබ සමග මෙම ගමනට එක්වන අතර අපගේ ස්වාමින් වහන්සේගේ ආශිර්වාදය ලැබීමට ඉතා ඕනෑකමින් යුතුව බලා සිටිමු.

දැනුත් මතුත් සදාකල්හිත් ක්‍රිස්තුන් වහන්සේ අප සමගය! ආමෙන්.

ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,



මෝරන් මෝර් ඇතනේසියස් පළමු යොහාන්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්.

දිනයඃ 2024-01-15
ස්ථානයඃ ශුද්ධ වූ සිනෝඩය